# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2072/24 – 2018 මැයි 23 වැනි බදාදා – 2018.05.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/2017/182.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2017.11.15 වැනි දින අංක 2045/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.11.10 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එක්සත් තේ රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, නො. 513 - 2/1, ඇල්විටිගල මාවත, කොළඹ 05.
(සේවකයන් 18 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ෆින්ලේස් කලම්බු ලිමිටඩ්, නො. 186, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර පවත්නා 2017.10.30 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.


1A – G 27713 – 12 (2018/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.11.10 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/2017/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එක්සත් තේ රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, නො. 513 - 2/1, ඇල්විටිගල මාවත, කොළඹ 05.
(සේවකයන් 18 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ෆින්ලේස් කලම්බු ලිමිටඩ්, නො. 186, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
2. ෆින්ලේ ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, නො. 309/6, මීගමු පාර, වැලිසර.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

''ෆින්ලේස් කලම්බු ලිමිටඩ් හා ෆින්ලේ ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතන දෙකෙහිම සේවය කළ පහත නම් සඳහන් සේවකයින් 18 දෙනාගේ සේවය ඒ ඒ ආයතනයන් විසින් විනය කරුණු මත අවසන් කිරීමෙන් ඔවුන් 18 දෙනාට අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදුව තිබේනම් ඔවුන්ට හිමි සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

01. ජී. වේලායුදන්
02. ඩබ්. ජී. බී. කමල් ජයසේන
03. ඩී. එම්. තීක්ෂණ
04. කේ. ඒ. නිමලසිරි
05. එන්. බාලසුප්‍රමනියම්
06. සරත් ගුරුගේ
07. ආර්. ආර්. පත්මසිරි
08. ජේ. එස්. ජේ. ප්‍රනාන්දු
09. ආර්. සී. ඩබ්. කේ. සිල්වා
10. එස්. ආර්. රොසයිරෝ
11. ඩබ්. එම්. විජිත විජේසිංහ
12. ඊ. ඩී. සුමිත් රණසිංහ
13. එස්. වික්‍රමසිංහ
14. ජේ. එම්. ඩී. එන්. ප්‍රියංකර
15. එල්. ඩී. සී. එන්. කුමාර
16. පී. බී. එස්. ගුණරත්න
17. ආර්. ඩී. දමින්ද
18. මෙලන් ෆැන්සිස්

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 මැයි මස 04 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 – 405

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.